# රබීන්ද්‍රනාත් තාගෝර්ගේ අධ්‍යාපන දර්ශනය

**තීක්ෂණ අතුකෝරල**

## 1.0 හැඳින්වීම

රබීන්ද්‍රනාත් තාගෝර් (1861-1941) නම් දාර්ශනිකයා ඉන්දියානු සාහිත්‍යය, දර්ශනය සහ අධ්‍යාපනය ආදී ක්ෂේත්‍රයන් හි කීර්තිධරයෙකි. සාහිත්‍යය පිළිබඳ නොබෙල් ත්‍යාගලාභී (1913) තාගෝර් කවියෙකු, නාට්‍ය රචකයෙකු සහ නවකතාකරුවෙකු පමණක් නොව, ලොව පුරා අධ්‍යාපන ක්‍රමවේදයන්ට හා අධ්‍යාපන පද්ධතීන්ට නවමු මාවතක් පිළිබඳ සිතීමට මාර්ගෝපදේශය සපයන ලද දූරදර්ශී අධ්‍යාපනඥයෙකු මෙන්ම දාර්ශනිකයෙකු ද විය. ප්‍රමුඛ බෙංගාලි පවුලක උපත ලැබූ තාගෝර්, ඉන්දියාවේ සංස්කෘතික හා අධ්‍යාත්මික සම්ප්‍රදායන්ගෙන් මෙන්ම බටහිර බුද්ධිමය ප්‍රවාහයන්ගෙන් ද බලපෑමට ලක් වූ විද්වතෙකි. ගීතාංජලි (Gitanjali -Song Offerings), නිවස සහ ලෝකය (The Home and the World) සහ උද්‍යානකරු (The Gardener) වැනි ඔහුගේ සාහිත්‍යය කෘති ඔහුගේ ගැඹුරු මානවවාදය සහ ප්‍රඥාව පිළිබිඹු කරයි. කෙසේ වෙතත්, ඔහුගේ සාහිත්‍යය ජයග්‍රහණවලින් ඔබ්බට, අධ්‍යාපනය සඳහා තාගෝර්ගේ දායකත්වය වනාහි දිගු කලක් පවතින උරුමයන්ගෙන් එකකි. ඔහු 1901 දී ශාන්ති නිකේතනය නම් පර්යේෂණාත්මක පාසලක් ආරම්භ කළ අතර එය පසුව විශ්ව-භාරතී විශ්වවිද්‍යාලය බවට පරිවර්තනය විය, එය නැගෙනහිර සහ බටහිර අධ්‍යාපන සම්ප්‍රදායයන් යාකරන පාලමක් නිර්මාණය කිරීමට උත්සාහ කළ අද්විතීය ආයතනයක් බව දාස්ගුප්තා (Dasgupta, 2009) විසින් පෙන්වා දී ඇත.

තාගෝර්ගේ අධ්‍යාපන දර්ශනය ඔහු ජීවත් වූ අවධියේ ඉන්දියාවේ පැවති දැඩි යටත් විජිත අධ්‍යාපන ක්‍රමයෙන් රැඩිකල් ලෙස බැහැරවීමකි. අධ්‍යාපනය පිළිබඳ ඔහු සිතුවේ සමස්ත සංවර්ධනය, නිර්මාණශීලීත්වය සහ සොබාදහම සහ මනුෂ්‍යත්වය සමඟ ගැඹුරු සම්බන්ධතාවයක් ශිෂ්‍යයා තුළ පෝෂණය කිරීමේ මාධ්‍යයක් ලෙසිනි. ඉගෙනීමේ නිදහස, අත්දැකීම් පාදක අධ්‍යාපනය

සහ කලා හා සංස්කෘතිය විෂයමාලාවට ඒකාබද්ධ කිරීම කෙරෙහි ඔහුගේ අවධාරණය, පාසල් අධ්‍යාපනය සඳහා සාම්ප්‍රදායික මෙන්ම විභාග නැඹුරු යටත්විජිතවාදී ප්‍රවේශයට දැඩි අභියෝගයක් එල්ල කළ බව ඕකොනෙල් (O'Connell, 2003) විසින් පෙන්වා දී ඇත. ඔහු තව දුරටත් පේනවා දෙනු ලබන්නේ තාගෝර්ගේ දර්ශනය තුළ අධ්‍යාපනය හුදෙක් ආර්ථික දියුණුව සඳහා ඇති මෙවලමක් නොව ස්වයං සොයාගැනීමේ සහ විශ්වීය මානව වටිනාකම් මානව සමාජය තුළ වගා කිරීමේ ක්‍රියාවලියක් විය යුතු බවයි.

භට්ටාචාර්ය (Bhattacharya, 2014) හා රූපකුමාර් පණ්ඩා (Panda, 2024) විසින් පෙන්වා දෙන පරිදි ගෝලීය අධ්‍යාපන සන්දර්භය තුළ, තාගෝර්ගේ අදහස් අදටත් සැලකිය යුතු අදාළත්වයක් දරයි. නූතන අධ්‍යාපන පද්ධති ප්‍රමිතිකරණය, නිර්මාණශීලීත්වය නොසලකා හැරීම සහ සොබාදහමෙන් විතැන්වීම වැනි ගැටලු සමඟ පොරබදන විට, තාගෝර්ගේ දර්ශනය, ඒ සඳහා අපූර්ව විසඳුම් සපයා දී ඇති බව භට්ටාචාර්ය තව දුරටත් පෙන්වා දී ඇත. බුද්ධිමය, චිත්තවේගීය සහ ආධ්‍යාත්මික වර්ධනයේ සුසංයෝගී මිශ්‍රණයක් ලෙස අධ්‍යාපනය පිළිබඳ ඔහුගේ දැක්ම, ඉගෙනීම සඳහා වඩාත් පූර්ණ අධ්‍යාපනයක් කරා මග පෙන්වා දී ඇත. තවද, ගෝලීය පුරවැසිභාවය සහ අන්තර් සංස්කෘතික සබඳතාව කෙරෙහි ඔහුගේ ඉගැන්වීම, 21 වන සියවසේ අධ්‍යාපනයේ අරමුණු සමඟ මනාව ගැළපෙන අතර එය සංකීර්ණ නූතන ලෝකය සඳහා සිසුන් සූදානම් කිරීමට අවශ්‍ය දාර්ශනික මග පෙන්වීම සිදු කරනු ලබයි.

මෙම ලිපියේ අරමුණ වන්නේ රබීන්ද්‍රනාත් තාගෝර්ගේ අධ්‍යාපනය පිළිබඳ දැක්ම ගවේෂණය කිරීම, එහි මූලික මූලධර්ම, ප්‍රායෝගික භාවිතය සහ කාලීන අදාළත්වය පිළිබඳ තාගෝර් සම්බන්ධයෙන් ලියැවී ඇති සාහිත්‍යය ආශ්‍රයෙන් අධ්‍යයනය කිරීමයි. තවදුරටත් සඳහන් කරන්නේ නම් මෙම ලිපිය තාගෝර්ගේ අදහස් නවීන අධ්‍යාපන භාවිතයන් තුළ භාවිත කළ හැකි ආකාරය පිළිබඳව විමර්ශනයකි. එසේ කිරීමෙන්, අධ්‍යාපනය සමාජයේ පරිවර්තනීය සහ විමුක්තිදායක බලවේගයක් ලෙස නැවත ක්‍රියාත්මක කිරීම සඳහා කතිකාවතකට දායක වීමට මංපෙත් විවර කරනු ඇත.

## 2.0 තාගෝර්ගේ දර්ශනයෙහි ඓතිහාසික හා දාර්ශනික සන්දර්භය

රබීන්ද්‍රනාත් තාගෝර් යනු බ්‍රිතාන්‍යයන් විසින් ඉන්දියාවේ පනවන ලද යටත්විජිත අධ්‍යාපන ක්‍රමය දැඩි ලෙස විවේචනය කළ අයෙකි. එම අධ්‍යාපන ක්‍රමය ඉන්දියානු සමාජයේ සංස්කෘතික, සාමාජීය සහ අධ්‍යාත්මික අවශ්‍යතාවලින් විතැන් වූ බව ඔහු විශ්වාස කළේය. කටපාඩම් ඉගෙනීම, දැඩි විෂයමාලා සහ විභාග-නැඹුරු ප්‍රතිඵල කෙරෙහි අවධාරණය කරන ලද යටත් විජිත ක්‍රමය, බුද්ධිමය හෝ නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය කිරීම හා පෝෂණය කිරීමට වඩා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට සේවය කිරීම සඳහා ලිපිකරුවන් සහ පරිපාලකයින් බිහි කිරීම සඳහා නිර්මාණය කර ඇති බව ඔහුගේ අදහස විය. මෙම ක්‍රමය පෞද්ගලිකත්වය, නිර්මාණශීලීත්වය සහ විවේචනාත්මක චින්තනය මැඩපවත්වන බවත්, අධ්‍යාපනය ප්‍රීතියෙන් හා අර්ථයෙන් තොර යාන්ත්‍රික ක්‍රියාවලියකට සීමා කරන බවත් තාගෝර් තර්ක කළ බව දාස්ගුප්තා (Dasgupta, 2009) විසින් පෙන්වා දී ඇත. තාගෝර් (Tagore, 1917: 45) ප්‍රසිද්ධියේ සඳහන් කළේ, "උසස්ම අධ්‍යාපනයක් යනු මිනිසාට තොරතුරු ලබා දීම පමණක් නොව, මිනිසාගේ ජීවිතයේ සියලු අවශ්‍යයතාවන්ට හා පැවැත්මට අනුකූලවන ලෙස මිනිසා හැඩගස්වන මාධ්‍යයක් බවයි". අධ්‍යාපනය විමුක්තිදායක බලවේගයක් විය යුතු බවට තාගෝර්ගේ විවේචන හා විශ්වාසයන් තුළ මුල් බැසගෙන තිබුණි. එමගින් පුද්ගලයන්ට ඔවුන්ගේ සම්පූර්ණ විභවය අවබෝධ කරගැනීමට සහ සමාජයට අර්ථවත් ලෙස දායකවීමට හැකියාව පවතින බව ඉන් ඔහු පෙන්වා දෙන ලදී.

### 2.1 ඉන්දියානු දාර්ශනික සම්ප්‍රදායයන් තාගෝර්ගේ දාර්ශනික ඉගැන්වීම් කෙරෙහි සිදු කරන ලද බලපෑම

තාගෝර්ගේ අධ්‍යාපනික දර්ශනය ඉන්දියානු දාර්ශනික සම්ප්‍රදායන්, විශේෂයෙන් උපනිෂද් සහ වේදාන්ත මගින් පෝෂණය වී ඇත. මෙම සම්ප්‍රදායයන් හා දාර්ශනික ඉගැන්වීම් තුළ ආත්මයේ පැවැත්ම, ස්වයං අවබෝධය තුළින් යථාර්ථය දැකීම සහ පුද්ගලයා විශ්වය සමඟ සහසම්බන්ධයක් ඇති බව අවධාරණය කර ඇත. සොබාදහම සහ විශ්වය සමඟ පුද්ගලයා සමබන්ධයක් ගොඩනගා ගැනීමේ මාධ්‍යයක් ලෙස අධ්‍යාපනය ක්‍රියාත්මකවීම පිළිබඳ

තාගෝර්ගේ සංකල්පය මෙම පූර්වෝක්තයෙන් සඳහන් කළ දාර්ශනික ඉගැන්වීම් පිළිබිඹු කරයි. නිදසුනක් වශයෙන්, වසුධෛව කුටුම්බකම් (ලෝකය එකම පවුලක්) පිළිබඳ උපනිෂද් අදහස, විශ්වීය මානවවාදය නමැති සංකල්පය පෝෂණය කිරීම සහ ජාතිය, ආගම සහ ජාතිකත්වයේ පටු සීමාවන් ඉක්මවා යාම සඳහා මෙවලමක් ලෙස අධ්‍යාපනය පිළිබඳ තාගෝර්ගේ දැක්ම සමඟ මනාව ගැළපෙන බව භට්ටාචාර්ය (Bhattacharya, 2014) විසින් පෙන්වා දී ඇත. ඊට අමතරව තාගෝර්ගේ දර්ශනය පුරාණ ඉන්දියාවේ ගුරුකුල ක්‍රමයෙන් ආභාෂය ලබාගෙන ඇත. එහිදී අතීතයේ දී ඉගෙනීම සොබාදහම සමඟ සමීප සහයෝගීතාවකින් සිදු වූ අතර ගුරු-ශිෂ්‍ය සම්බන්ධතාව අන්‍යෝන්‍ය ගෞරවය සහ ඔවුන් තුළ ඇතිවන සංවාද මත පදනම්ව සිදුව ඇත. එකී ගුරු-ශිෂ්‍ය සම්බන්ධතාවය හා සොබාදහම සමඟ සමීප සබඳතාවය තාගෝර් විසින් මනාව අවධාරණය කර ඇති බව ඕ කොනෙල් (O'Connell, 2003) විසින් පෙන්වා දී ඇත.

## 2.2 බටහිර බලපෑම් සහ ඉන්දියානු පරමාදර්ශ සමඟ සමෝධානය වීම

තාගෝර් ඉන්දියානු සම්ප්‍රදායයන් තුළ ගැඹුරින් මුල් බැස ගත් අතර, ජීන්-ජැක්වින් රූසෝ, ජොහාන් හෙන්රිච් පෙස්ටලෝසි සහ මාරියා මොන්ටිසෝරි වැනි බටහිර අධ්‍යාපනික චින්තකයින්ගේ බලපෑමට ද ලක්ව ඇත. රූසෝගේ ස්වභාවිකත්වය සහ දරුවෙකුගේ සහජ කුතුහලය සහ නිර්මාණශීලිත්වය පෝෂණය කිරීමේ වැදගත්කම පිළිබඳ අවධාරණය කිරීම සමග ඉගෙනීමේ නිදහස පිළිබඳ තාගෝර්ගේ අදහස් සමග මනාව ගැළපේ. ඒ හා සමානව අත්දැකීම් සහිත ඉගෙනීමට සහ සමස්ත දරුවාගේ සංවර්ධනයට ප්‍රමුඛත්වය දෙන අධ්‍යාපනය සඳහා මොන්ටිසෝරිගේ ළමා කේන්ද්‍රීය ප්‍රවේශය, තාගෝර්ගේ පරිපූර්ණ අධ්‍යාපනය පිළිබඳ දැක්ම සමඟ සමපාත වන බව මුඛර්ජි (Mukherjee, 2015) විසින් පෙන්වා දී ඇත. කෙසේ වෙතත් තාගෝර් මෙම බටහිර අදහස් පමණක් අනුගමනය කළේ නැත. ඔහු ඒවා ඉන්දියානු දාර්ශනික හා සංස්කෘතික වටිනාකම් සමඟ ඒකාබද්ධ කළේය. නිදසුනක් වශයෙන්, ඔහු ඒක පුද්ගල නිදහස සහ නිර්මාණශීලිත්වය පිළිබඳ බටහිර අවධාරණය වැළඳ ගත් අතර, ඔහු එය ඉන්දියානු සාරධර්ම අතර වැදගත්වන ධර්ම හෙවත් යුතුකම නැමැති සංකල්පය සහ සාමූහික යහපත පිළිබඳ පරමාදර්ශය සමඟ

ඒකාබද්ධ කළේය. මෙම සමෝධානය ඔහු ශාන්ති නිකේතනයේ දී වර්ධනය කළ අධ්‍යාපනික ආකෘතියෙන් මනාව පැහැදිලි වේ. එහිදී සිසුන්ට ඔවුන්ගේ සංස්කෘතික රටාවන් සහ ස්වාභාවික ලෝකය සමඟ සම්බන්ධ වෙමින් ඔවුන්ගේ පෞද්ගලික නිදහස අත්විඳීමට අවස්ථාව සලසා දුන් බව දාස්ගුප්තා (Dasgupta, 2009) විසින් පැහැදිලි කර ඇත.

## 3. තාගෝර්ගේ අධ්‍යාපනික දර්ශනයේ මූලික මූලධර්ම

### 3.1 සාකල්‍ය සංවර්ධනය: මනස, ශරීරය සහ ආත්මය ඇතුලු පූර්ණ අධ්‍යාපනය

රබීන්ද්‍රනාත් තාගෝර්ගේ අධ්‍යාපනික දර්ශනය පුද්ගලයෙකුගේ බුද්ධිමය, ශාරීරික, චිත්තවේගීය සහ අධ්‍යාත්මික මානයන් පෝෂණය කිරීමට උත්සාහ කළ සාකල්‍ය (Holistic) සංවර්ධනය පිළිබඳ සංකල්පය තුළ ගැඹුරින් මුල් බැස තිබුණි. අධ්‍යාපනය ශාස්ත්‍රීය දැනුමට පමණක් සීමා නොවිය යුතු බවත්, නිර්මාණශීලීත්වය, ශාරීරික යහපැවැත්ම සහ සදාචාරාත්මක වර්ධනය ද පෝෂණය කළ යුතු බවත් ඔහු විශ්වාස කළේය. දරුවෙකුගේ සමතුලිත සංවර්ධනය සඳහා මෙම සාධක අත්‍යවශ්‍ය බව තර්ක කරමින්, විෂය මාලාවට කලාව, සංගීතය සහ ශාරීරික ක්‍රියාකාරකම් ඒකාබද්ධ කිරීම තාගෝර් අවධාරණය කළ සුවිශේෂ කරුණකි. ශාන්ති නිකේතනයේ දී, සිසුන් තම අධ්‍යයන කාර්යයන් සමඟ චිත්‍ර, නැටුම්, ගෙවතු වගාව සහ ක්‍රීඩා වැනි ක්‍රියාකාරකම්වල නිරත වූ අතර, මනස, ශරීරය සහ ආත්මයේ ඒකාබද්ධ වූ සංවර්ධනය පිළිබඳ තාගෝර්ගේ විශ්වාසය එමගින් මනාව පිළිබිඹු කරන බව දාස්ගුප්තා (Dasgupta, 2009) සහ රෙඩ්ඩි (Reddy, 2021) විසින් පෙන්වා දී ඇත. ඔහුගේ දැක්ම සාකල්‍යය අධ්‍යාපනය පුරාණ ඉන්දියානු දාර්ශනික ඉගැන්වීම් වන "ශාරීරික, මානසික සහ ආධ්‍යාත්මික සංවර්ධනය (physical, mental, and spiritual development) " තුළින් ආභාෂය ලැබී ඇති බව පැහැදිලිය. භට්ටාචාර්ය (Bhattacharya, 2014) පෙන්වා දෙන්නේ මෙම පුරාණ ඉන්දීය දාර්ශනික ඉගැන්වීම් නවීන අධ්‍යාපනයේ අවශ්‍යතා සපුරාලීම සඳහා නැවත අර්ථකථනය කළ බවයි. තාගෝර්ගේ "සාකල්‍ය ප්‍රවේශය" පූර්ණ වශයෙන් දරුවාගේ සංවර්ධනය වෙනුවෙන් පෙනී

සිටින සමකාලීන අධ්‍යාපන න්‍යායන් සමඟ මනාව ගැළපෙන බව භට්ටාචාර්ය සහ පාවුල් (Paul & Bhattacharya, 2022) විසින් වැඩි දුරටත් පැහැදිලි කර ඇත.

### 3.2 ඉගෙනීමේ නිදහසඃ පැවැති දෘඩි රාමුගත අධ්‍යාපනයට විරුද්ධ වීම, නිර්මාණශීලිත්වය සහ ස්වයං අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම

තාගෝර් යටත් විජිත අධ්‍යාපනය තුළ ක්‍රියාත්මක වන දැඩි හා ව්‍යුහගත අධ්‍යාපන රටාවන් පිළිබඳ දැඩිලෙස හෙළාදකින ලදී. එවැනි අධ්‍යාපන රටාවන් නිර්මාණශීලිත්වය සහ පෞද්ගලිකත්වය යටපත් කළ බව ඔහු විශ්වාස කළේය. නිදහස, කුතුහලය සහ ස්වයං ප්‍රකාශනයට ප්‍රමුඛත්වය දෙන අධ්‍යාපන ක්‍රමයක් සඳහා ඔහු පෙනී සිටියේය. ඉගෙනීම බියෙන් හෝ බලහත්කාරයෙන් මෙහෙයවනු ලබන යාන්ත්‍රික ක්‍රියාවලියක් නොව ප්‍රීතිමත් සහ විමුක්තිදායක අත්දැකීමක් විය යුතු බව තාගෝර් තර්ක කළේය. ශාන්ති නිකේතනයේ දී ඔහු විවෘත හා නම්‍යශීලී ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කළ අතර එහි දී සිසුන්ට ඔවුන්ගේ රුචිකත්වයන් සහ ආශාවන් හඳුනාගැනීමට අවස්ථාව සලසා දෙන ලදී. ගුරුවරුන් අධිකාරීවාදී චරිතවලට වඩා පහසුකම් සපයන්නන් හෙවත් සුසාධ්‍යකාරකවරුන් ලෙස ක්‍රියා කළ යුතු අතර සිසුන් තුළ විමර්ශනශීලීත්වය සහ නිර්මාණශීලීත්වය පිළිබඳ කුසලතාවන් පෝෂණය කරන පිරිසක් බවට පරිවර්තනය විය යුතු බව තාගෝර් අවධාරණය කර ඇති බව ඕ කොනෙල් (O'Connell, 2003) විසින් පෙන්වා දී ඇත. ඉගෙනීමේ නිදහස පිළිබඳ මෙම අවධාරණය කිරීම ස්වාභාවිකත්වය සහ ළමා කේන්ද්‍රීය අධ්‍යාපනය අවධාරණය කළ රූසෝ සහ අත්දැකීම් සහිත සහ ස්වයං-අවබෝධය සහිත ඉගෙනීමේ ප්‍රවේශයක් සඳහා පෙනී සිටි මොන්ටිසෝරි වැනි බටහිර චින්තකයින්ගේ බලපෑම තාගෝර්ගේ අධ්‍යාපන දර්ශනයෙන් ප්‍රදර්ශනය වන බව මුකර්ජී (Mukherjee, 2015) විසින් පෙන්වා දී ඇත. කෙසේ වෙතත් තාගෝර්ගේ මෙම අධ්‍යාපන ප්‍රවේශය අද්විතීය ලෙස ඔහුටම ආවේණික ශෛලියකින් ඉන්දියානු සංස්කෘතික සන්දර්භය තුළ මුල් බැස ගත් අතර, එකී අධ්‍යාපන ප්‍රවේශය ඉන්දියානු ගුරුකුල සම්ප්‍රදායට අනුගත වෙමින් සහයෝගශීලී හා සංවාදශීලී අධ්‍යාපන රටාවක් සංවර්ධනය කළ බව චක්‍රබෝර්ටි (Chakraborty, 2012) සඳහන් කර ඇත.

### 3.3 සොබාදහම සමඟ ඒකාබද්ධ කිරීම: ස්වාභාවික පරිසරයන්හි ඉගෙනීම සහ පරිසරය හා ශිෂ්‍යයා සමග සහසම්බන්ධතාවක් ගොඩ නැගීම

තාගෝර්ගේ අධ්‍යාපනික දර්ශනයේ වඩාත්ම කැපී පෙනෙන අංගයක් වූයේ සොබාදහම සමඟ ඒකාබද්ධ කිරීම කෙරෙහි ඔහුගේ ඉගැන්වීමයි. සාම්ප්‍රදායික පන්ති කාමරවල සීමාවන්ගෙන් බැහැරව ස්වාභාවික පරිසරයන් තුළ ඉගෙනීම සිදුවිය යුතු බව ඔහු විශ්වාස කළේය. ශාන්ති නිකේතනයේ පන්ති බොහෝ විට ගස්වල සෙවණ යට එළිමහනේ පවත්වන ලද අතර සිසුන්ට සොබාදහම සමඟ සම්බන්ධ වීමට සහ ඔවුන්ට එම වටපිටාවන්ගෙන් ආස්වාදයක් ලබා ගැනීමට ඉඩ සලසා දෙන ලදී. තාගෝර් ස්වභාව ධර්මය දුටුවේ පුදුමය, කුතුහලය සහ පරිසරය කෙරෙහි ගෞරවය ඇති කළ හැකි බලවත් ගුරුවරයෙකු ලෙසින් බව දාස්ගුප්තා (Dasgupta, 2009) සහ මෙහෙතා (Mehta, 2010) විසින් පෙන්වා දී ඇත. මෙම ප්‍රවේශය ඉගෙනුම් අත්දැකීම සංවර්ධනය කිරීම පමණක් නොව පාරිසරික විඥ්ඥාණය සහ ස්වාභාවික ලෝකය කෙරෙහි ගැඹුරු අගයක් ශිෂ්‍යයා තුළ ජනිත කිරීමක් ද ඇති කිරීමට සමත්ව ඇති බව ඝෝෂ් (Ghosh, 2013) විසින් පෙන්වා දී ඇත. නූතන සමාජයන් පාරිසරික හායනය සහ තිරසාර ජීවන රටාවක අවශ්‍යතාව සමඟ පොරබදමින් සිටින බැවින්, සොබාදහම සමඟ සුසංයෝගී අන්තර්ක්‍රියාවක් ලෙස අධ්‍යාපනය පිළිබඳ තාගෝර්ගේ දැක්ම වත්මනට විශේෂයෙන් අදාළ වන බව නස්බවුම් (Nussbaum, 2010) සඳහන් කර ඇත.

### 3.4 විශ්වීය මානවවාදය: ජාතිය, ආගම සහ ජාතිකත්වයේ සීමාවන් ඉක්මවා යාමේ මාධ්‍යයක් ලෙස අධ්‍යාපනය

තාගෝර්ගේ අධ්‍යාපන දර්ශනය ජාතිය, ආගම සහ ජාතිකත්වය යන බෙදීම් ඉක්මවා යාමට උත්සාහ කළ විශ්වීය මානවවාදය නැමැති සුවිශේෂ සංකල්පයකින් සමන්විත විය. අධ්‍යාපනය ගෝලීය පුරවැසිභාවය සහ සෑම ජාතියක් අතරම අන්තර් සම්බන්ධිතභාවය පිළිබඳ හැඟීමක් ඉගෙනුම්ලාභියා තුළ පෝෂණය කළ යුතු බවත්, විවිධ සංස්කෘතීන් අතර සාමය සහ අවබෝධය ප්‍රවර්ධනය කළ යුතු බවත් තාගෝර් විශ්වාස කළේය. තාගෝර් ලොව පුරා සිසුන්

සහ විද්වතුන් එක් කරන විශ්ව-භාරති නමින් අද්විතීය ආයතනයක් නිර්මාණය කළේය. සංවාදය සහ අදහස් හුවමාරුව දිරිමත් කළ එම ආයතනය ඔහුගේ අධ්‍යාපන දර්ශනය භාවිතය සඳහා තෝතැන්නක් වූ බව (Dasgupta, 2009) දාස්ගුප්තාගේ මතයයි. විශ්ව භාරතී-හෙවත් ලෝකය එක් පවුලක් ලෙස සැලකීමේ මෙම ප්‍රවේශය පිළිබඳ ඔහුගේ සංකල්පය විශේෂ වනුයේ සියලුම මනුෂ්‍යයින් අතර එකමුතුකම සාක්ෂාත් කර ගැනීමේදී, අධ්‍යාපනයේ කාර්යභාර්යය ප්‍රමුඛවන බව තාගෝර් විස්වාස කළ නිසාය. තාගෝර්ගේ විශ්වීය මානවවාදය පිළිබඳ දැක්ම, යුනෙස්කෝවේ තිරසාර සංවර්ධනය සඳහා වූ අධ්‍යාපනය වැනි නූතන ප්‍රවේශයන් තුළ දක්නට ලැබෙන පරිදි, ගෝලීය අධ්‍යාපනය සහ අන්තර් සංස්කෘතික අවබෝධය ප්‍රවර්ධනය කිරීම සඳහා සමකාලීන උත්සාහයන් සමඟ මනාව ගැළපෙන බව සෙන් (Sen, 2005) විසින් පැහැදිලි කර ඇත.

### 3.5 අත්දැකීම් පාදක ඉගෙනීමඃ කටපාඩම් කිරීමට වඩා ප්‍රායෝගික ඉගෙනීම කෙරෙහි අවධාරණය කිරීම

තාගෝර් යනු අත්දැකීම් පාදක ඉගෙනුම් ප්‍රවේශයේ ප්‍රබල උපදේශකයෙකු වූ අතර, ඔහු කටපාඩම් කිරීමට වඩා ප්‍රායෝගික අත්දැකීම් පුද්ගල සංවර්ධනය සඳහා බලපාන බව අවධාරණය කළේය. ප්‍රායෝගික අවබෝධය සහ අත්දැකීම් සැබෑ ලෝකය සමඟ ගනුදෙනු කිරීමෙන් පමණක් ලබාගත හැකිබව ඔහු විශ්වාස කළේය. ශාන්ති නිකේතනයෙහි සිසුන් ගොවිතැන, ශිල්ප සහ ප්‍රජා සේවය වැනි ක්‍රියාකාරකම්වලට සහභාගී වූ අතර එමගින් ඔවුන්ට සැබෑ ලෝකයේ ඉගෙනුම් අවස්ථා සපයා දුන් බව ඕ කොනෙල්ගේ (O'Connell, 2003) අදහසයි. තාගෝර් තර්ක කළේ අධ්‍යාපනය දෛනික ජීවිතයට අදාළ විය යුතු අතර ප්‍රායෝගික අභියෝගවලට මුහුණ දීම සඳහා අවශ්‍ය කුසලතා සහ දැනුමෙන් සිසුන් සන්නද්ධ කළ යුතු බවයි. ඉගෙනීම සඳහා තාගෝර්ගේ මෙම ප්‍රවේශය ඔහුගේ දර්ශනය ඉදිරිපත් වූ කාලයට වඩා ඉදිරි පියවරක් වූ අතර ක්‍රියාශීලී සහ අත්දැකීම් සහිත ඉගෙනීමේ වැදගත්කම අවධාරණය කරන ජෝන් ඩුවීගේ ප්‍රායෝගිකවාදය වැනි නවීන අධ්‍යාපන න්‍යායයන් සමඟ සමීපව සම්බන්ධවන බව නස්බවුම් (Nussbaum, 2010) විසින් පැහැදිලි කර ඇත. අත්දැකීම් සහිත ඉගෙනීම කෙරෙහි තාගෝර්ගේ අවධාරණය,

එදිනෙදා ජීවිතයේ යථාර්ථයන් සමඟ අධ්‍යාපනය ඒකාබද්ධ කිරීම පිළිබඳ ඔහුගේ දැක්ම ද පිළිබිඹු කරයි. එය සමකාලීන අධ්‍යාපනයේ ඉතා වැදගත් මූලධර්මයක් බව ගෝෂ්ගේ (Ghosh, 2013) අදහස වී ඇත.

## 4.0 ගුරුවරුන් සහ සිසුන් පිළිබඳ තාගෝර්ගේ දැක්ම

### 4.1 අධිකාරී චරිතයක් නොව, මාර්ගෝපදේශකයෙකු සහ සුසාධ්‍යකාරකවරයෙකු ලෙස ගුරුවරයාගේ භූමිකාව

රබීන්ද්‍රනාත් තාගෝර් අධ්‍යාපන ක්‍රියාවලියේ දී ගුරුවරයාගේ භූමිකාව නැවත අර්ථ දැක්වීය. ඔහු සාම්ප්‍රදායික ඒකාධිපති ආකෘතියෙන් ඉවත් වී මඟ පෙන්වීම සහ පහසුකම් සැපයීමේ ආකෘතියකට ගමන් කළේය. එනම් සුසාධ්‍යකාරකවරයෙකු දක්වා ගුරු භූමිකාව සංවර්ධනය කිරීමයි. ගුරුවරුන් සිසුන් මත දැනුම පැටවිය යුතු නැති බවත්, ඒ වෙනුවට ඔවුන්ගේ සහජ කුතුහලය සහ නිර්මාණශීලිත්වය දිරිමත් කරන සහ පෝෂණය කරන උපදේශකයින් ලෙස ගුරුවරයා ක්‍රියා කළ යුතු බවත් ඔහු විශ්වාස කළේය. ගුරුවරයාගේ කාර්යභාරය සිසුන්ට නිදහසේ දැනුම ගවේෂණය කිරීමට, ප්‍රශ්න කිරීමට සහ දැනුම් කුසලතා සොයා යෑමට උචිත පරිසරයක් නිර්මාණය කිරීම බව තාගෝර් අවධාරණය කළේය. ශාන්ති නිකේතනයේ දී, ගුරුවරුන් සලකන ලද්දේ ඉගෙන ගත යුතු දේ නියම කරන අධිකාරියේ පුද්ගලයින් ලෙස නොව තම සිසුන් සමඟ සහයෝගීව කටයුතු කරමින් නව දැනුම් කුසලතා සොයායෑමේ ගමනක නියැලී සිටින සම-ඉගෙනුම්කරුවන් ලෙසින් බව දාස්ගුප්තා (Dasgupta, 2009) පෙන්වා දී ඇත. අධ්‍යාපනයේ පෞද්ගලිකත්වය සහ ස්වයං අධ්‍යයනයේ වැදගත්කම පිළිබඳ තාගෝර්ගේ විශ්වාසය මෙන්ම යටත් විජිත පාසල් අධ්‍යාපනයේ දැඩි ධූරාවලි ව්‍යුහයන් පිළිබඳ ඔහුගේ විවේචනය මෙම ප්‍රවේශය හඳුන්වා දීමට බලපෑ ඇතැයි ඕ කොනෙල් (O'Connell, 2003) විසින් පේනවා දී ඇත.

### 4.2 ඉගෙනුම් ක්‍රියාවලියේ ක්‍රියාකාරී සහභාගි වන්නෙකු ලෙස ශිෂ්‍යයා

තාගෝර් සිසුන් සැලකුවේ නිෂ්ක්‍රීය තොරතුරු ලබන්නන් ලෙස නොව ඉගෙනුම් ක්‍රියාවලියේ සක්‍රීය සහභාගිවන්නන් ලෙසය. අධ්‍යාපනය ගතික හා අන්තර්ක්‍රියාකාරී අත්දැකීම් සමුදායක එකතුවක් විය යුතු බවත්, එම අධ්‍යාපන ක්‍රියාවලියට ශිෂ්‍යයා සම්බන්ධවීමෙන් පසුව සැබෑ ලෝකයේ සාර්ථකව ජීවත්වීමට අවශ්‍ය කරන ශක්‍යතාව ලැබිය යුතු බවත් ඔහු විශ්වාස කළේය. ශාන්ති නිකේතනයේ දී අධ්‍යයන, කලා හෝ ගොවිතැන සහ ශිල්ප වැනි ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් හෝ ඔවුන්ගේ රුචිකත්වයන් සහ ආශාවන් තුළින් තමාගේ දැනුම් පරාසය තුළ ඉදිරියට යාමට සිසුන් දිරිමත් කරන ලදී. අත්දැකීම් පාදක ඉගෙනීම කෙරෙහි තාගෝර්ගේ අවධාරණයෙන් අදහස් කළේ සිසුන් තමා ජීවත්වන පරිසරය හා අන්තර්ක්‍රියා කිරීමෙන් සැබෑ දැනුම අත් කර ගන්නා බවයි. මෙම ප්‍රවේශය සිසුන් අතර නායකත්වය සහ වගකීම පිළිබඳ හැඟීමක් ඇති කළ අතර, ඔවුන් ස්වකීය ජීවිත කාලය පුරාම ඉගෙන ගන්නන් සහ විවේචනාත්මක චින්තකයින් බවට පත්වීමට ඉඩ සලසන බව භට්ටාචාර්යගේ (Bhattacharya, 2014) මතයයි.

### 4.3 ගුරුවරුන් සහ සිසුන් අතර අන්‍යොන්‍ය ගෞරවය සහ සුහද අන්තර් සම්බන්ධතාවයේ වැදගත්කම

තාගෝර්ගේ අධ්‍යාපන දර්ශනයේ කේන්ද්‍රීය සාධකය වූයේ ගුරුවරුන් සහ සිසුන් අතර අන්‍යොන්‍ය ගෞරවය සහ අන්තර් සම්බන්ධතාවය පිළිබඳ අදහසයි. අධ්‍යාපනය සහයෝගී සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් විය යුතු බවත්, එහි දී ගුරුවරුන් සහ සිසුන් දෙදෙනාම එකිනෙකාගෙන් ඉගෙන ගන්නා බවත් ඔහු විශ්වාස කළ බව බැනර්ජි (Banerjee, 2018) විසින් පෙන්වා දී ඇත. ශාන්ති නිකේතනයේ දී ගුරුවරුන් සහ සිසුන් අතර පැවැති සම්බන්ධතාව විවෘතභාවය, විශ්වාසය සහ අන්‍යොන්‍ය ගෞරවය යන ගුණාංගවලින් සමන්විත විය. ගුරුවරුන් තම සිසුන්ගේ අදහස් සහ දෘෂ්ටිකෝණයන්ට සවන් දීමට දිරිමත් කරන ලද අතර, අර්ථවත් හා ඵලදායී ගුරු-සිසු අන්තර් සබඳතා ඇති ඉගෙනුම් වාතාවරණයක් නිර්මාණය කළ බව ගෝෂ් (Ghosh, 2013) සිය කෘතියේ සඳහන් කර ඇත. මෙම ප්‍රවේශය ඉගෙනුම් අත්දැකීම් විෂයමාලාව තුළ සංවර්ධනය කිරීමට පමණක්

නොව සියලුම පාසල් පාර්ශ්වකරුවන් තුළ අන්‍යෝන්‍ය වශයෙන් යහපත් හැඟීමක් ගොඩනැගීමට ද උපකාරී වී ඇත. ඵලදායී අන්තර් සම්බන්ධතාවය සහ ගෞරවය කෙරෙහි තාගෝර්ගේ ඉගැන්වීම, පුද්ගලයන් අතර සමඟිය සහ අවබෝධය වර්ධනය කිරීමේ මාධ්‍යයක් ලෙස අධ්‍යාපනය ක්‍රියාත්මක වීම පිළිබඳ ඔහුගේ පුළුල් දැක්ම ප්‍රදර්ශනය වන බව නෂ්බවුම් (Nussbaum, 2010) පෙන්වා දී ඇත.

**4.4 සමකාලීන අධ්‍යාපනයේ සඳහා තාගෝර්ගේ දර්ශනයේ අදාළත්වය**

නිර්මාණවාදය, අත්දැකීම් පාදක ඉගෙනීම හා ශිෂ්‍යය කේන්ද්‍රීය අධ්‍යාපනය වැනි නූතන අධ්‍යාපනික න්‍යායයන් සමඟ සංසන්දනය කිරීම තුළින් රබීන්ද්‍රනාත් තාගෝර්ගේ අධ්‍යාපනික දර්ශනයේ වැදගත්කම පිළිබඳ මනා අවබෝධයකට එළඹිය හැක. ජීන් පියාජේ සහ ලෙව් විගොට්ස්කි වැනි න්‍යායාචාර්යවරුන් විසින් මෙහෙයවන ලද නිර්මාණවාදය මඟින් ඉගෙන ගන්නන් තම පරිසරය සමඟ ක්‍රියාකාරී සහභාගීත්වයෙන් සහ අන්තර් ක්‍රියාවන්ගෙන් දැනුම ගොඩනගන බව අවධාරණය කර ඇත. ඒ හා සමානව තාගෝර්ගේ අත්දැකීම් පාදක ඉගෙනීම තුළ ද එකී ලක්ෂණය ක්‍රියාත්මකවී ඇත. එහි දී සිසුන් තම අත්දැකීම් ලබා ගැනීමෙන් සහ එම අත්දැකීම් පිළිබඳ ප්‍රත්‍යවේක්ෂයේ යෙදීමෙන් දැනුම හා කුසලතා සංවර්ධනය කරගනියි. මුඛර්ජි (Mukherjee, 2015) පෙන්වා දෙනු ලැබූයේ ශාන්ති නිකේතනයේ දී සිසුන් ගොවිතැන, ශිල්ප සහ ප්‍රජා සේවය වැනි විෂය ක්ෂේත්‍රයන් තුළ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වූ අතර එමඟින් ඔවුන්ට න්‍යායාත්මකව තමා උගත් දැනුම සැබෑ ලෝකයේ යෙදවීමට අවස්ථාව සැලසුන බවයි. නිර්මාණශීලීත්වය, ස්වයං ප්‍රකාශනය සහ විවේචනාත්මක චින්තනය කෙරෙහි තාගෝර්ගේ අවධාරණය, අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ඉගෙනුම්ලාභියාගේ ක්‍රියාකාරී භූමිකාවට ප්‍රමුඛත්වය ලබාදීම නූතන ඉගෙනුම් ප්‍රවේශයන් සමඟ සමපාතවන බව නස්බවුම්ගේ (Nussbaum, 2010) අදහසයි. තව ද පුද්ගලයාගේ පූර්ණ සංවර්ධනය කෙරෙහි තාගෝර්ගේ ඉගැන්වීම, ප්‍රජානන කුසලතා පමණක් නොව මනෝචාලක, චිත්තවේගීය, සමාජීය සහ සදාචාරාත්මක කුසලතා වර්ධනයට ද පෝෂණය කිරීමට උපාකාරීවන සමකාලීන ප්‍රවේශයන් සමග මනාව ගැළපෙන බව ඝෝෂ් (Ghosh, 2013) විසින් පෙන්වා දී ඇත.

## 5.0 අධ්‍යාපනයේ වත්මන් අභියෝග සඳහා තාගෝර් දර්ශනයේ උපයෝගීතාව

තාගෝර්ගේ අධ්‍යාපනික දර්ශනය සමකාලීන අධ්‍යාපනයේ වඩාත්ම දැවෙන අභියෝග කිහිපයක් ආමන්ත්‍රණය කිරීම සඳහා ශක්තිමත් පදනමක් සකස් කිරීමට උපයෝගීවන බව බොහෝ පර්යේෂකයන්ගේ මතයයි. නිදසුනක් ලෙස දැඩි විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය සහ විෂයමාලා පාදක අධ්‍යාපනය සිසුන්ගේ සැබෑ ඉගෙනුම් අවස්ථාවන් අහිමි කිරීමේ ගැටලුව සඳහා තාගෝර්ගේ අත්දැකීම් පාදක ඉගෙනීම් ප්‍රවේශය කදිම ආදේශකයක් බව පිළිගැනේ. අධ්‍යාපනය ප්‍රීතිමත් සහ ජීවිතය සාර්ථකව ගත කිරීමට අවශ්‍ය කුසලතා සපයා දීම සඳහා කැප වූ ක්‍රියාවලියක් විය යුතු බව තාගෝර් විශ්වාස කළේය. එය සිසුන්ගේ පුද්ගල අවශ්‍යතා සහ සමාජීය අවශ්‍යතාවලට අනුව සකස් කළ යුතු ක්‍රියාවලියක් විය යුතු බව තාගෝර් විසින් වැඩිදුරටත් පෙන්වා දී ඇත. නිර්මාණශීලීත්වය, ස්වයං අධ්‍යයනය, විවේචනාත්මක චින්තනය සහ නවෝත්පාදනය යන තාගෝර්ගේ ඉගැන්වීම, කටපාඩම් කිරීම සහ පරීක්ෂණ ලකුණු සඳහා ප්‍රමුඛත්වය දීමේ වර්තමාන ප්‍රවණතාවයට ප්‍රතිවිරුද්ධ සැබෑ අධ්‍යාපන දාර්ශනික මග පෙන්වීමක් සිදු කරන බව දාස්ගුප්තා (Dasgupta, 2009) විසින් පෙන්වා දී ඇත.

නූතන අධ්‍යාපනයේ තවත් සැලකිය යුතු අභියෝගයක් වන්නේ සොබාදහමෙන් සහ පරිසරයෙන් විතැන්ව අධ්‍යාපනය ක්‍රියාත්මක වීමයි. ස්වාභාවික පරිසරය තුළ ඉගෙනීම පිළිබඳ තාගෝර්ගේ දැක්ම, පාරිසරය පිළිබඳ ශිෂ්‍යය අවබෝධය සහ ස්වභාවික පරිසරයේ තිරසාරභාවය ඇතිකරලීම සඳහා මනා පිටුවහලක් සහිත ඉගෙනුම් ප්‍රවේශයකි. දේශගුණික විපර්යාස සහ පාරිසරික ගැටලු සමඟ පොරබදමින් සිටින ලෝකයක, ඔහුගේ අදහස් නූතන මිනිසා අධ්‍යාපනය ඔස්සේ ස්වභාව ධර්මය හා ඒකාබද්ධ කිරීමට ගත් උත්සහයක් බව භට්ටාචාර්යා (Bhattacharya, 2014) විසින් පැහැදිලි කර ඇත. එමෙන්ම විශ්වීය මානවවාදය සහ අන්තර් සංස්කෘතික අවබෝධය පිළිබඳ තාගෝර්ගේ ඉගැන්වීම් නූතන ගෝලීයකරණය වූ ලෝකයට සෘජුවම අදාළ වේ. එහිදී අධ්‍යාපනය තුළින් විවිධ

සංස්කෘතීන්ට ගරු කිරීමට සහ සමාජ සහජීවනය ප්‍රවර්ධනය කිරීමට සිසුන් සූදානම් කරන බව (Nussbaum, 2010) නස්බවුම් විසින් සඳහන් කර ඇත.

බොහෝ අධ්‍යාපනඥයින් පුද්ගල භෞතික දියුණුව කෙරෙහි අවධාරණය කර ඇති නමුත් තාගෝර් විසින් කායික සහ මානසික දියුණුව හා සමානවම මිනිසාගේ ආධ්‍යාත්මය දියුණු කළ යුතු බව අවධාරණය කළ දාර්ශනිකයෙකි. චක්‍රබෝර්ටි (Chakraborty, 2024) විසින් තාගෝර්ගේ මිනිස් ආධ්‍යාත්මයේ සංවර්ධනය හා එහි අධ්‍යාපනික අදාළත්වය පිළිබඳ සිදුකරන ලද පර්යේෂණය මගින් පෙන්වා දෙන්නේ මිනිසාගේ ශක්‍යතාවන් අධ්‍යාපන ක්‍රියාවලිය මගින් ඔප්නංවන්නාසේම ගැඹුරු අවබෝධය සහිත ස්වකීය ජීවිතය පිළිබඳ දර්ශනයක් පදනම් කරගනිමින් ජීවත්වීමට අවශ්‍යය පදනම ද අධ්‍යාපනය විසින් ගොඩනගන බවය. නූතන යාන්ත්‍රික අධ්‍යාපනය මගින් බිහිවන යාන්ත්‍රික හා සංකීර්ණ සමාජයකට වඩා උචිතවනුයේ එම ගැඹුරු අවබෝධය සහිත මිනිස් සමාජයක් බව සෙන් (Sen, 2021) විසින් තහවුරු කර ඇත. එයින් ගම්‍යය වන්නේ නූතන සමාජයේ දිශානතිය තීරණය කිරීම සඳහා සැබෑ මගපෙන්වීමක් තාගෝර්ගේ අධ්‍යපන දර්ශනය මගින් පිළිබිඹු කරන බවය.

### 6. නිගමනය

අධ්‍යාපන දර්ශනයට රබීන්ද්‍රනාත් තාගෝර්ගේ දායකත්වය ගැඹුරු සහ දූරදර්ශී එකකි. ඔහු අධ්‍යාපනය පිළිබඳ දරන මතය වූයේ මනස, ශරීරය සහ ආත්මය පෝෂණය කරන, නිර්මාණශීලිත්වය, නිදහස සහ සොබාදහම සමඟ සහසම්බන්ධය අවධාරණය කරන පරිපූර්ණ ක්‍රියාවලියක් ලෙසය. ශාන්ති නිකේතනය සහ විශ්ව-භාරතී යන විද්‍යා ආයතන පිහිටුවීම තුළින් අධ්‍යාපනයට, දැඩි යටත් විජිත පාලනයෙන් මිදී, සීමාවන් ඉක්මවා ගොස් එළදායී ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කළ හැකි ආකාරය තාගෝර් ක්‍රියාවෙන්ම තහවුරු කරන ලදී. අත්දැකීම් පාදක ඉගෙනීම, විශ්වීය මානවවාදය සහ අධ්‍යාපනය, කලාව සහ සංස්කෘතිය ඒකාබද්ධ කිරීම පිළිබඳ ඔහුගේ අදහස් තවමත් නූතන ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශයන් තුළ මුල් බැසගෙන ඇත. තාගෝර්ගේ අධ්‍යාපන දර්ශනය ඉන්දියානු අධ්‍යාපන සම්ප්‍රදායයන් තුළ ගැඹුරින් මුල් බැස ගත් අතර ගෝලීය චින්තකයන් ද ඉන් ආභාෂය

ලබා ගන්නා ලදී. එය ආසියානු සහ බටහිර දර්ශනයන් හි අඩංගු අද්විතීය දැනුමෙහි ඒකාබද්ධයක් බව දාස්ගුප්තා (Dasgupta, 2009) සහ භට්ටාචාර්ය (Bhattacharya, 2014) විසින් පෙන්වා දී ඇත.

21 වන සියවස තුළ තාගෝර්ගේ අධ්‍යාපන දර්ශනය අඛණ්ඩව ඉදිරියට පැමිණෙමින්, වඩ වඩාත් ප්‍රමිතිගත හා යාන්ත්‍රික අධ්‍යාපන ක්‍රම බැහැර කරමින් බලගතු විකල්පයක් ලෙසින් ඉස්මතුව ඇත. සාකල්‍යය සංවර්ධනය හෙවත් පූර්ණ අධ්‍යාපනය, ඉගෙනීමේ නිදහස සහ සොබාදහම සමඟ අන්‍යෝන්‍ය සම්බන්ධතාව ආදී ඔහුගේ ඉගැන්වීම්, නිර්මාණශීලිත්වය නොසලකා හැරීම සහ ස්වාභාවික ලෝකයෙන් විතැන් වීම වැනි නවීන අධ්‍යාපනයේ ඇති බොහෝ අඩුපාඩු ආමන්ත්‍රණය කරයි. පාරිසරික විඥානය, ගෝලීය පුරවැසිභාවය සහ අන්තර් සංස්කෘතික අවබෝධය පෝෂණය කිරීමේ මාධ්‍යයක් ලෙස තාගෝර්ගේ අධ්‍යාපනය පිළිබඳ දැක්ම සර්වකාලීන අදාළ වන බව නස්බවුම්ගේ සහ (Nussbaum, 2010) සහ ගෝෂ්ගේ (Ghosh, 2013) අදහසයි. තාගෝර්ගේ ඉගැන්වීම් අවධාරණය කරනුයේ අධ්‍යාපනය හුදෙක් ආර්ථික දියුණුව සඳහා මෙවලමක් නොව මිනිස් ජීවිත පොහොසත් කරන සහ ප්‍රජාවන් ශක්තිමත් කරන පරිවර්තනීය ක්‍රියාවලියක් විය යුතු බවයි.

අවසාන වශයෙන් රබීන්ද්‍රනාත් තාගෝර්ගේ අධ්‍යාපන දර්ශනය තුළින් අධ්‍යාපනය කුමන තත්ත්වයක පවතී ද සහ අධ්‍යාපනයට කුමක් විය යුතුද යන්න පිළිබඳ කාලානුරූපී විශ්ලේෂණාත්මක දැක්මක් ඉදිරිපත් කර ඇති බව පැහැදිලිය. අධ්‍යාපනයේ අරමුණු පිළිබඳ නැවත සිතා බැලීමට සහ සැබෑ ලෝකයේ අත්දැකීම් ආශ්‍රයෙන් මිනිසාට ඉගැන්වීමට මගපෙන්වන අතරම සෑම පුද්ගලයෙකුගේම පූර්ණ විභවය පෝෂණය හා සංවර්ධනය කරන අධ්‍යාපන ප්‍රවේශයන් නිර්මාණය කිරීම සඳහා උත්සාහ කිරීමට තාගෝර් නම් ශ්‍රේෂ්ඨයාගේ දර්ශනය අපට මග පෙන්වා ඇත. නූතනයේ පවතින දැඩි සංකීර්ණ සමාජ ක්‍රමය තුළ ජීවත්වීමේ දී තාගෝර්ගේ ප්‍රඥාව මඟ පෙන්වන ආලෝකයක් ලෙස අපට භාවිත කළ හැකි අතර, ඔහුගේ මගපෙන්වීම තුළින් ගොඩනගනු ලබන අධ්‍යාපන ප්‍රවේශයක් තුළින් වඩාත් සාධාරණ, සහානුකම්පිත සහ සියලුම දෙනාට පොදුවේ පිළිගත හැකි ලෝකයක් ගොඩනැගීමට නූතන සමාජයට හැකියාව ලැබෙනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Banerjee, A. (2018). ‘Implementing Tagorean methods in today’s classroom: A case study’, *Journal of Educational Innovation*, 9(1), pp. 66–81.

Bhattacharya, S. (2014). *Rabindranath Tagore: An Interpretation*. New Delhi: Penguin Books India.

Chakraborty, A. (2018). ‘The educational philosophy of Rabindranath Tagore and Rishi Aurobindo Ghosh’, *International Journal of Research and Analytical Reviews*, 5(3), pp. 278–283.

Chakraborty, R. (2012). *Tagore and the Reconstruction of Education in India*. Kolkata: Progressive Publishers.

Chakraborty, R. (2024). ‘Rabindranath Tagore’s spiritual humanism and its educational relevance’, *The Open Journal of Quality in Education*, 10(2), pp. 2471–2485.

Das, P. and Bera, S. (2020). ‘Influence of Rabindranath Tagore’s philosophical thought on school education in present India’, *Infokara Research*, 9(10), pp. 346–354.

Dasgupta, S. (2001). *The Bengal Renaissance: Identity and Creativity from Rammohun Roy to Rabindranath Tagore*. New Delhi: Permanent Black.

Dasgupta, U. (2009). *The Oxford India Tagore: Selected Writings on Education and Nationalism*. Oxford: Oxford University Press.

Ghosh, R. (2013). *Education for Peace: Tagore’s Vision and Its Contemporary Relevance*. New Delhi: Orient BlackSwan.

Mehta, J. (2010). ‘Rethinking Tagorean pedagogy: Lessons from Santiniketan’, *International Journal of Progressive Education*, 6(4), pp. 112–129.

Mondal, S. (2023). ‘Educational ideas and contributions of Rabindranath Tagore’, *International Research Journal of Modernization in Engineering Technology and Science*, 5(12), pp. 391–396.

Mukherjee, M. (2015). *Education for Wholeness: The Vision of Rabindranath Tagore*. New Delhi: Routledge.

Nussbaum, M. C. (2010). *Not for Profit: Why Democracy Needs the Humanities. Princeton*, NJ: Princeton University Press.

O’Connell, C. M. (2003). *Rabindranath Tagore: The Poet as Educator*. Kolkata: Visva-Bharati Publishing Department.

Panda, R. (2024) .'Exploring the philosophical foundations of Rabindranath Tagore's educational ideals: A qualitative study', TIJER – *International Research Journal*, 11(8), pp. a521–a526. Available at: https://tijer.org/TIJER/papers/TIJER2408066.pdf (Accessed: 27 May 2025).

Paul, S. and Bhattacharya, S. (2022). 'Rabindranath Tagore's educational philosophy: Nurturing holistic development through experiential learning', *International Journal of Research and Public Review*, 4(8), pp. 123–137.

Quayum, M. A. (2022). 'Education for tomorrow: The vision of Rabindranath Tagore', in *Rabindranath Tagore's Journey as an Educator*, pp. 119–139. London: Routledge.

Reddy, M. (2021). 'Blending holistic education and transformative learning in Rabindranath Tagore's Patha Bhavana', *Review of Research*, 8(1), pp. 1–13.

Sen, A. (2005). *The Argumentative Indian: Writings on Indian History, Culture, and Identity*. New York: Farrar, Straus and Giroux.

Sen, A. (2021). 'Tagore and the "divine in nature": A critique of mechanistic pedagogy', *Journal of Philosophical Education*, 12(3), pp. 55–72.

Tagore, R. (1917). *Personality*. London: Macmillan and Co.